සැ. යු. – 1996.06.21 වැනි දින අංක 929 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 930 – 1996 ජූනි 28 වැනි සිකුරාදා – 1996.06.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස – පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... | 962 |
| තනතුරු – ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බදුකාසිරාදිය විකිණීම් ... ... | — |
| තෝඩුපල්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. – (i) ඒකාබද්ධ ජාතික ගොවි ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 1995 දෙසැම්බර් මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව දහත් කෙටුම්පත, ශ්‍රී මංගල වැව විහාර එක්සත් ආශ්‍රිත, අංගම්කල, දිළිඳු පුද්ගල සහන සේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, මැදමුලන කිංචිගුනේ බෝධිමලුව පුරාණ රජමහාවිහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත සහ ප්‍රවර්ධ ශ්‍රී ලංකා ජාතික පෙරමුණ (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 1995 දෙසැම්බර් මස 29 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය පාර්ලිමේන්තුවේ 1995 අංක 18 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත, 1995 අංක 19 දරන උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත, 1995 අංක 20 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත සහ 1995 අංක 21 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (සංශෝධන) පනත, 1995 ඔක්තෝබර් මස 20 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

සැ. යු. – මෙවර පළවන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභික නාමාවලියක් ඇතුළත් වේ.

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන භාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාද දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාද දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු – ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව – එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර ඇතෙන කාල වේලාවන් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1996 ජූලි මස 05 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1996 ජූනි මස 21 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබේනා සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1996 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

961—B 077154—22,075 (96/06)
F 1 - B 077154*

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාතේ පළාත් සභාව

1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය

### 7(1) වගන්තිය යටතේ නියෝගය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තියේ 7(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග, අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය, හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ වන මම 1992 දෙසැම්බර් මස 18 වන දින අංක 746 දරන ගැසට් නිවේදනයේ IV (අ) වැනි පළාත් සභා කොටසෙහි අංක 1752 සහ 1753 පිටුවල පළ කරන ලද නියෝගයෙහි (ඌ) විෂයය යටතේ "ලී බඩු" යන වචනය ඉවත් කොට ඒ වෙනුවට "ගෘහ භාණ්ඩ" යන වචනය ආදේශ කිරීමෙන් එම නියෝගය සංශෝධනය කිරීමට නියම කරමි.

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/1

---

## සබරගමුව පළාතේ පළාත් සභාව

1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය

### 5(1) වගන්තිය යටතේ නියෝගය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 5(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග, අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය, හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් ව්‍යාපාර 1995 නොවැම්බර් මස 17 වන දින සිට පිරිවැටුම් බද්දෙන් නිදහස් කරමි.

"ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සබරගමුව පළාතේ පිහිටි සමුපකාර සමිති".

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/2

## සබරගමුව පළාතේ පළාත් සභාව

1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය

### 5(1) වගන්තිය යටතේ නියෝගය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 5(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග, අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය, හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් ව්‍යාපාර 1995 නොවැම්බර් මස 17 වන දින සිට පිරිවැටුම් බද්දෙන් නිදහස් කරමි.

"ශ්‍රී ලංකාවෙන් පිටත ගැණුම්කරුවන්ට භාණ්ඩ කිසිවක් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම".

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/3

---

## සබරගමුව පළාතේ පළාත් සභාව

1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය

### 07(1) වැනි වගන්තිය යටතේ නියෝගය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 07(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග, අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය, හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ වන මම 1992.12.18 වැනි දින අංක 746 දරන ගැසට් නිවේදනයේ IV(අ) වැනි පළාත් සභා කොටසෙහි අංක 1752 හා 1753 පිටුවල පළ කරන ලං නියෝගයේ (ඌ) විෂයය යටතේ ස්වර්ණාභරණ සහ ඇඟුම් ආයිත්තම් සඳහා වූ ස්වර්ණාභරණ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් බදු අනුප්‍රමාණය වූ සියයට 10, 1995 නොවැම්බර් මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත්කොට, ඒ වෙනුවට එදින සිට බලපවත්වන පරිදි සියයට 5ක බදු අනුප්‍රමාණය ආදේශ කිරීම නියම කරමි.

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/4

## සබරගමුව පළාතේ පළාත් සභාව

### සංශෝධනය කිරීමයි

### 1993 අංක 2 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

1994 පෙබරවාරි මස 15 වැනි දින අංක 806/2 දරන ගැසට් පත්‍රයෙහි IV(අ) වැනි පළාත් සභා කොටසෙහි 2ඒ පිටුවෙහි පළකරන ලද ඉහත සඳහන් මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තියෙහි 07 වැනි පේළියේ අගට සඳහන් "අවුරුදු 02 ක් වූ කාල සීමාවක්" යන වචන වෙනුවට "අවුරුදු 05ක් වූ කාල සීමාවක්" යනුවෙන් සංශෝධනය විය යුතු ය.

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/5

---

## සබරගමුව පළාතේ පළාත් සභාව

### 1994 අංක 10 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

### 1වන වගන්තිය යටතේ නියෝගය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 1994 අංක 10 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 1 දරන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග, අධ්‍යාපන, පළාත් පරිපාලන, බලශක්ති සහ ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය, හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ වන මම 1996 ඔක්තෝබර් 01 වන දිනය මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් මෙම නියෝගය මගින් නියම කරමි.

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/6

---

## සබරගමුව පළාතේ පළාත් සභාව

### 1994 අංක 10 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

### 6(1) වගන්තිය යටතේ නියෝගය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 1994 අංක 10 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 6(1) දරන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග, අධ්‍යාපන, පළාත් පරිපාලන, බලශක්ති සහ ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය, හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ වන මම 1996.10.01 වන දින සිට යම් තුරග තරඟයකදී තබන ලද හෝ පිළිගනු ලැබූ සෑම ඔට්ටුවකක් සඳහාම සියයට 5ක බද්දක් නියම කරමි.

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/7

---

## සබරගමුව පළාතේ පළාත් සභාව

### සංශෝධනය කිරීමයි

### 1995 අංක 02 දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය

1995 දෙසැම්බර් මස 29 වැනි දින අංක 904 දරන ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි පළාත් සභා කොටසෙහි 2691 සහ 2692 යන පිටුවල පළ කරන ලද ඉහත සඳහන් අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තියේ 3 වැනි පේළියේ අගට සඳහන් "අවුරුදු දෙකක කාලයක් ඇතුළත" යන වචන "අවුරුදු පහක කාලයක් ඇතුළත" යනුවෙන් සංශෝධනය විය යුතුය.

හේරත් රාළලාගේ ජයතිලක පොඩිනිලමේ,
සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන
අමාත්‍ය හා මුදල්, නීතිය හා සාමය, සැලසුම්
සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ඉඩම්, මාර්ග,
අධ්‍යාපන, පළාත් පරිපාලනය, බලශක්ති සහ
ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මැයි මස 30 වැනි දින,
රත්නපුර දී ය.

06-430/8

මගේ අංකය :- එන්සීපී/පීසී/එස්/90/14.

## උතුරු මැද පළාතේ පළාත් සභාව

1993 ඔක්තෝබර් මස 01 වැනි දින අංක 787 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ පළ කරන ලද උතුරු මැද පළාත් සභාවේ 1990 අංක 14 දරන පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තියේ 7:1 වගන්තියට අදාල උපලේඛනයක් මේ සමඟ පළ කරනු ලැබේ.

ර. හේ. සෝමවීර,
සභා ලේකම්,
උතුරු මැද පළාත් සභාව.

1996 මැයි මස 21 වැනි දින,
උතුරු මැද පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
මහ ලේකම් ගොඩනැගිල්ල,
අනුරාධපුරය.

### උපලේඛනය

**උතුරු මැද පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීමේ කාර්ය පරිපාටියට අදාල උපලේඛනය**

1. ක්‍රියාත්මක වන දිනය : 1.1 උතුරු මැද පළාත් සභාවේ 1990 අංක 14 දරන ප්‍රඥප්තිය සභා සම්මත වීමෙන් අනතුරුව එය උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පිළිගනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

2.බඳවා ගැනීමේ පරිපාටිය : 2.1 සභා ලේකම්වරයාගේ පත්වීම හැර අන් සියළුම පත්වීම් හා උසස් කිරීම් මෙම කාර්ය පරිපාටියට හා ඒ ඒ සේවාවන් වලට අදාලව කාර්ය මණ්ඩල උපදේශක කමිටුව විසින් අනුමත කර ඇති ව්‍යවස්ථා සංග්‍රහ වේනොත් එම ව්‍යවස්ථා සංග්‍රහවලටද යටත් වන්නේය. කාර්ය පරිපාටි හා ව්‍යවස්ථා වෙනස් කිරීමේ බලතල ගරු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සමන්විත කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ අනුමැතිය අනුව සිදුවිය යුත්තේය.

3.වැටුප් පරිමාණය :

| අනු අංකය | තනතුර | තනතුරු ගණන | රා. පරි. චක්‍රලේඛ 387 වැටුප් මණ්ඩය | රා. පරි. චක්‍රලේඛ 37/92 වැටුප් මණ්ඩය |
|---|---|---|---|---|
| 01. | සභා ලේකම් | 01 | ආර්. 10:5 | එස්. 8:1 |
| 02. | සහකාර ලේකම් | 01 | ආර්. 6:1 | එස්. 6:1 |
| 03. | පරිපාලන නිලධාරී | 01 | ආර්. 5:1 | එස්. 5:1 |
| 04. | ප්‍රධාන ලිපිකරු | 01 | ආර්. 2:5 | එස්. 2:5 |
| 05. | ලිපිකරු | 05 | ආර්. 2:2 | එස්. 2:2 |
| 06. | හැන්සාඩ් සංස්කාරක | 01 | ආර්. 3:6 | එස්. 3:6 |
| 07. | භාෂා පරිවර්තක I පෙළ | 01 | ආර්. 2:5 | එස්. 2:5 |
| 08. | භාෂා පරිවර්තක II පෙළ | 01 | ආර්. 2:3 | එස්. 2:3 |
| 09. | යතුරු ලේඛක I පෙළ (සිංහල) | 01 | ආර්. 2:5 | එස්. 2:5 |
| 10. | යතුරු ලේඛක (ඉංග්‍රීසි) | | ආර්. 2:2 | එස්. 2:2 |
| 11. | ලඝු යතුරු ලේඛක I පෙළ (සිංහල) | 01 | ආර්. 2:5 | එස්. 2:5 |
| 12. | ලඝු යතුරු ලේඛක II පෙළ (සිංහල) | 01 | ආර්. 2:3 | එස්. 2:3 |
| 13. | ආරක්ෂක | 01 | ආර්. 1:4 | එස්. 1:4 |
| 14. | කාර්යාල සේවක(ප: පන්:) | 03 | ආර්. 1:3 | එස්. 1:3 |
| 15. | කාර්යාල කම්කරු | 01 | ආර්. 1:2 | එස්. 1:2 |
| 16. | සනීපාරක්ෂක කම්කරු | 01 | ආර්. 1:2 | එස්. 1:2 |
| 17. | රියැදුරු | 02 | ආර්. 2:1 | එස්. 2:1 |

සටහන.- ඒ ඒ තනතුරුවලට අදාල එම වැටුප් පරිමාණ ඒවා ක්‍රියාත්මක වූ දින සිට සභා ලේකම් කාර්ය මණ්ඩලයටද අදාල විය යුතුය.

වෙනත් පහසුකම්.- උපදේශක කමිටුවේ අනුමැතිය ඇතිව එක් එක් ශ්‍රේණිය සඳහා ගැලපෙන පරිදි නිල ඇඳුම් ලබා දෙනු ඇත.